කොළඹ විශ්වවිද්‍යාලය - ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී විශේෂ උපාධි සිව්වන වසර පරීක්ෂණය

පළමු සෙමෙස්තරය 2021 / 2022

# SLG 4173 - විශ්ව සාහිත්‍ය පරිචය

(පැ දෙකයි)

- ප්‍රශ්න <u>තුනකට (03)</u> පමණක් පිළිතුරු සපයන්න.

---

1. "සම්භාව්‍ය රුසියානු කෙටිකතාව සර්වකාලීන වූත් සර්වභෞමික වූත් නිර්මාණාත්මක විශිෂ්ටත්වයක් ප්‍රකට කරයි". පද්මහර්ෂ කුරණගේ සිංහලයට පරිවර්තනය කළ **'සම්භාව්‍ය රුසියානු කෙටිකතා'** සංග්‍රහයේ කෙටිකතා තුනක් **(03)** ඇසුරෙන් සාකච්ඡා කරන්න.

2. අප්‍රිකානු සමාජ-සංස්කෘතික යථාර්ථය ප්‍රතිනිර්මාණය කිරීමෙහිලා චිනුවා අචෙබේ, 'ඔකොන්කෝ' ප්‍රමුඛ සෙසු චරිත නිරූපණය ඉවහල් කොට ගෙන ඇති ආකාරය ආරියදාස සෝමතිලක විසින් සිංහලයට පරිවර්තනය කරන ලද **'මුහුද ගොඩගලා'** නවකතාව ඇසුරෙන් විභාග කරන්න.

3. මිනිසා සහ සොබාදහම අතර වන අනවරත අරගලය ඇසුරින් සංකීර්ණ සමාජ යථාර්ථය ප්‍රතිනිර්මාණය කිරීමට අර්නස්ට් හෙමින්වේ සමත් වී ඇති ආකාරය සිරිල් සී. පෙරේරා සිංහලයට පරිවර්තනය කළ **'මහල්ලා සහ මුහුද'** නවකතාව ආශ්‍රයෙන් විමර්ශනය කරන්න.

4. "පුද්ගලිකත්වය සහ මනුෂ්‍යත්වය විෂයෙහි ස්ත්‍රියගේ අනන්‍යතාව තහවුරු කිරීම හෙන්රික් ඉබ්සන්ගේ අරමුණයි." සුනිල් විජේසිරිවර්ධන සිංහලයට පරිවර්තනය කළ **'බෝනික්කි ගෙදර'** නාට්‍ය පිටපත ඇසුරු කොටගෙන විමසන්න.

5. විශ්ව සාහිත්‍යය පරිශීලනය පාඨකයාගේ ජීවිතාවබෝධය පෘථුල කිරීමෙහිලා ඉවහල් වන ආකාරය සිංහලයට පරිවර්තනය කරන ලද ඔබ කැමති නවකතාවක් ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.